**පොතුවිල් ප්‍රාදේශීය සභාව - 2022**

-------------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

පොතුවිල් ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උප වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට පොතුවිල් ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය සහ මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම්, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම් අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍යයන් සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

### 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත්වේ.

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

### 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය | සභාවේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ප්‍රාදේශීය සංවර්ධන ප්‍රදාන වැඩසටහන යටතේ සමාලෝචිත වර්ෂයේ අවසන් වූ ගොඩනැගිලි ඉදිකිරීම් කටයුතුවල අවසන් ගෙවීම් රු.5,672,645ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | ඉදිරි මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කරන බව. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ උසාවි දඩ ගාස්තු සහ මුද්දර ගාස්තු රු.12,302,808ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | -එම- | -එම- |

### 1.6.2 නොසැසඳුණු පාලන ගිණුම් හෝ වාර්තා

| සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය | සභාවේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ ශේෂ පත්‍රයේ සහ ශේෂ පත්‍ර සටහන්වල විෂයන් දෙකක් අතර රු.581,474,742 ක වෙනසක් පැවැතුණි. | ඉදිරි මූල්‍ය වර්ෂයේ නිවැරදි දැක්වීමට කටයුතු කරනු බව. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන ආදායම ඉක්ම වූ වියදම් රු.18,181,148 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් ඉක්ම වූ ආදායම රු.14,696,274 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සභාව විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| | | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම් | බිල්කළ ආදායම් | රැස්කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම් | බිල්කළ ආදායම් | රැස්කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| i. | වරිපනම් හා බදු | 1,625,000 | 1,625,000 | 750,000 | 875,000 | 1,510,000 | 1,510,000 | - | 1,510,000 |
| ii. | කුලී | 18,820,000 | 29,462,566 | 7,831,967 | 13,568,608 | 18,870,000 | 15,927,282 | 5,284,716 | 10,642,566 |
| iii. | බලපත්‍ර ගාස්තු | 4,910,000 | 2,642,220 | 2,642,220 | 2,267,780 | 4,360,000 | 2,020,150 | 2,020,150 | - |
| iv. | වෙනත් ආදායම් | 8,705,000 | 5,798,665 | 5,798,665 | 2,906,334 | 6,550,000 | 6,550,000 | 7,927,123 | - |
| | එකතුව | 34,060,000 | 44,702,566 | 17,022,852 | 19,617,722 | 31,290,000 | 26,007,432 | 15,231,989 | 12,152,566 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ සියළුම ආදායම් රැස්කිරිමේ කාර්යසාධනය පිළිබඳ නිරීක්ෂණයන් පහත දැක්වේ.

| | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය | සභාවේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| **(අ)** | **වරිපනම් හා බදු** | | |
| | වසර 16 කට අධික කාලයක සිට ප්‍රාදේශීය සභා පනතේ 134 වගන්තිය ප්‍රකාරව, සභා බලප්‍රදේශයේ පිහිටි නිවාස දේපළ 11,652 ක් සහ ව්‍යාපාරික ස්ථාන 528 ක් සඳහා වාර්ෂික වටිනාකම මත වරිපනම් බදු පනවා අය කිරීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි. | වරිපනම් බදු පනවා අයකිරීමට කටයුතු කරන බව. | වරිපනම් බදු පනවා අයකිරීමට කටයුතු කළ යුතුය. |
| **(ආ)** | **කුලී** | | |
| (i) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අය කළ යුතු රු.4,287,520 ක වෙළෙඳපොල කඩ කාමර කුලී මුදලින් රු.171,520ක් වර්ෂ 10 සිට 20ක් දක්වා දීර්ඝ කාලයක සිට කුලී හිමියන් 11කගෙන් අය විය යුතුව පැවතුණි. | ඉදිරි කාලයේදී අයකිරීමට කටයුතු කරන බව. | අයකළ යුතු ආදායම් කඩිනමින් අයකිරීමට පියවර ගත යුතුය. |
| (ii) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වා බදු දීමෙන් ලැබිය යුතු රු.9,281,088 කින් 1995 සිට 2021 දක්වා කාලපරිච්ඡේදයට අදාල හිඟ හිටි ශේෂය රු.5,388,936 ක් විය. | දීර්ඝකාලයක සිට පැවත එන හිඟමුදල් කපා හැරීමටත් 2020 හා 2021 වර්ෂවල හිඟ මුදල් අය කර ගැනීමටත් කටයුතු කරන බව. | ආදායම් කඩිනමින් අයකිරීමට හෝ කපාහැරීමට පියවර ගත යුතුය. |

**(ඇ) මුද්දර ගාස්තු**

| | | |
|---|---|---|
| 2019 සිට 2022 දක්වා කාලපරිච්ඡේදයට අදාල මුද්දර ගාස්තු, සභාව විසින් යවනු ලැබූ මුද්දර ගාස්තු ප්‍රමාණය සහ නැගෙනහිර පළාත් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් එවනු ලැබූ ප්‍රමාණය අතර වෙනස රු.595,850ක් වූවත්, එම වෙනස සසඳා ලැබිය යුතු නිවැරදි මුද්දර ගාස්තු වටිනාකම ලබා ගැනිමට කටයුතු කර නොතිබුණි. | මෙම වෙනසෙහි වටිනාකම ඉල්ලුම් කර ලබාගැනීමට කටයුතු කරන බව. | ලැබිය යුතු මුද්දර ගාස්තු ගෙන්වා ගැනීමට පියවර ගත යුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභ සාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය | සභාවේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2015 වර්ෂයේ ලි බඩු මිලදී ගැනිම සඳහ සභාවේ අරමුදලින් ලබා දුන් රු.1,999,907ක් සහකාර පළාත් පාලන කොමසාරිස් වරයාගෙන් ප්‍රතිපූර්ණය කරවාගෙන නොතිබුණි. | අයවැයෙහි මූල්‍ය ප්‍රතිපාදන සලසා තිබූ අතර එම වටිනාකම නිමා කිරීමට තීරණය කරන බව. | ප්‍රතිපූර්ණය කරවා ගැනීමට පියවර ගත යුතුය. |
| (ආ) | පොදු වෙළෙඳ පොලේ පවතින කඩකාමර 39ක් සඳහා පිළියෙල කළ ගිවිසුම් සඳහා කඩකුලී ලාභීන්ගේ අත්සන් ලබා නොගැනීම නිසා අය කර ගත යුතු රු.3,276,000ක හිඟ කුලී සම්බන්ධව නීතිමය ක්‍රියාමාර්ග මගින් අයකර ගැනීමට සභාවට නොහැකි වී තිබුණි. | කුලී හිමියන්ගෙන් අත්සන් ලබාගැනීමටත් හිඟකුලි අය කර ගැනිමටත් පියවර ගෙන ඇති බව. | හිඟකුලී නීතිමය ක්‍රියාමාර්ග මගින් අයකර ගැනීමට පියවර ගත යුතුය. |
| (ඇ) | සභාවට අයත් අදායම් ඉපැයිය හැකි යන්ත්‍ර දෙකක් සහ බර වාහනයක් වර්ෂ 01 සිට 06 ක් දක්වා කාලයක් අළුත්වැඩියා නොකර නිෂ්කාර්යව පැවතුණි. | මෙම යන්ත්‍ර අළුත්වැඩියා කර ආදායම් ඉපැයීමට කටයුතු කරන බව. | අළුත්වැඩියා කර නැවත භාවිතා කිරීමට පියවර ගත යුතුය. |
| (ඈ) | වර්ෂ 06 කට අධික කාලයක සිට අක්‍රියව පවතින බැංකු ජංගම ගිණුම් 03ක ශේෂ එකතුව රු.925,064 ක් | අක්‍රියව පවතින් බැංකු ශේෂ නියමිත ක්‍රමවේදයන් අනුගමනය කර ආදායම් ඉපැයීමේ මූලාශ්‍රයන්හි | ආදායම් ඉපැයීමේ මූලාශ්‍රයන්හි යෙදවීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ඵලදායී ලෙස ආයෝජනය කර නොතිබුණි. | යෙදවීමට කටයුතු කරන බව. | |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේ පළාත් පාලන දෙපාර්තමේන්තුව සහ පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලයෙන් පරිත්‍යාග ලැබූ අයිතම 27 ක වටිනාකම් ගණනය කර ගිණුම් ගත කර නොතිබුණි. | ඉදිරි මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කරන බව. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙළ කළ යුතුය. |

**3.2 නිෂ්කාර්ය වත්කම්**

| සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය | සභාවේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමලෝචිත වර්ෂයේ සභාවේ පොතුවිල් පොදු වෙළෙඳපොල ගොඩනැගිල්ලේ ඉහළ මහලේ පිහිටි කඩකාමර 16 ක් සම්පූර්ණ කර කුලියට දීමට සභාව විසින් විධිමත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | මෙම කඩකාමර අංග සම්පූරණ කර කුලියට දීමට කටයුතු කරන බව. | කඩකාමර කඩිනමින් අංග සම්පූර්ණ කර කුලියට දීමට කටයුතු කළ යුතුය. |

**3.3 වත්කම් කළමනාකරණය**

| | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය | සභාවේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සභාවට අයත් සහ සභාව විසින් භාවිතා කරනු ලබන ඉඩම්, ගොඩනැගිලි 264 ක් සහ වාහන 42 ක වටිනාකම සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | ඉදිරි කාලයේ හිමිකාරිත්ව ලේඛන ලබාගෙන ඒවා ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව. | ප්‍රත්‍යාගණනය කර එහි තථ්‍ය වටිනාකම ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | වසර 05 කට අධික කාලයක සිට නිෂ්ක්‍රියව පවතින සභාව සතු වාහන 20 ක් අලුත්වැඩියා කර නැවත භාවිතා කිරීමට හෝ සුදුසු පරිදි අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. | සභාවේ අරමුදල් උපයෝගි කරමින් අළුත්වැඩියා කිරීමට කටයුතු කරන බව. | අලුත්වැඩියා කර නැවත භාවිතා කිරීමට හෝ වෙන්දේසියේ විකිණීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | සභාව භාවිතා කරනු ලබන වාහන 11ක හිමිකාරිත්වය සභාවේ නමට මාරුකිරීමට විගණන දිනය වන විටත් කටයුතු කර නොතිබුණි. | සභාවේ නමට මාරු කිරිමට කටයුතු කරන බව. | වාහනවල හිමිකාරිත්වය සභාවේ නමට මාරුකිරීමට පියවර ගත යුතුය. |
| (ඈ) | ජාත්‍යන්තර ආධාර ආයතනයක් විසින් 2013 වර්ෂයේදී සභාවට භාරදී තිබූ ඩබල් කැබ් රථයේ හිමිකාරිත්වය, බද්ද ගෙවා සභාවේ නමට මාරුකර නොමැති වීම හේතුවෙන් මෙම රථයට පූර්ණ රක්ෂණාවරණයක් සභාවට ලබාගත නොහැකිව තිබුණි. මේ නිසා අදාල රථය සමාලෝචිත වර්ෂයේ අනතුරට පත්වී අළුත්වැඩියා සඳහා රු.235,000ක් සභාවේ අරමුදලින් ගෙවීමට සිදු විය. | ඉදිරි කාලයේ රථයේ හිමිකාරිත්වය, බද්ද ගෙවා සභාවේ නමට මාරුකර ගැනිමට කටයුතු කරන බව. | රථයේ හිමිකාරිත්වය බද්ද ගෙවා සභාවේ නමට මාරු කර ගැනිමට කටයුතු කළ යුතුය. |

## 3.4 ප්‍රසම්පාදන කළමනාකරණය

| සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය | සභාවේ අදහස් දැක්වීම |
|---|---|---|
| රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 මාර්ගෝපදේශය ප්‍රකාරව සහ 2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අය වැය දෙපාර්තමේන්තු චක්‍රලේඛය ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේ සැපයුම් හා සේවාවන් සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි. | ඉදිරියේදී ප්‍රසම්පාදන සැලැස්ම මගින් එක් වරකදී මිලදී ගැනීම් සිදුකිරිමට කටයුතු කරන බව. | ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීමට කටයුතු කළ යුතුය. |

## 3.5 මානව සම්පත් කළමනාකරණය

| | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය | සභාවේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සභාවේ සේවක පුරප්පාඩු 16ක් සහ සේවකයින් 02 කගේ අතිරික්තයක් පැවැතුණු අතර එම සේවකයින් වාර්ෂික ස්ථාන මාරු පටිපාටියේ සඳහන් කරුණුවලට අනුකූලව කටයුතු කර නොතිබුණි. එසේම, සභාවේ පුරප්පාඩුව පවතින තනතුරු වෙනුවට දින 180 වැඩසටහනට අන්තර්ග්‍රහනය කළ සේවකයින් 12ක් සිටි නමුත් සභාව විසින් ඊට අමතරව අනියම් පදනමින් සේවකයින් 52ක් පත්කර සහා අරමුදලින් ගෙවීම් කිරිමට ඔවුන්ට වාර්ෂිකව රු.12,435,835 ක් වැය කර තිබුණි. | ඉදිරි කාලයේදී මෙය නිවැරදි කිරිමට කටයුතු කරන බව. | වාර්ෂික ස්ථාන මාරු පටිපාටියේ සඳහන් කරුණුවලට අනුකූලව කටයුතු කිරීමටත් කිරිමටත් පුරප්පාඩු පිරවීමටත් කටයුතු කළ යුතුය. |
| (ආ) | සේවය හැර ගිය, මිය ගිය, ස්ථාන මාරුවී ගිය නිලධාරීන් 19ක් සහ තාවකාලික සේවකයින් 05ක ගෙන් අයවිය යුතු හිඟ ණය ශේෂ එකතුව රු.1,254,609 ක් අයකර ගැනිම සඳහා සභාව විසින් සුදුසු ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | අය කළ යුතු හිඟ ණය ශේෂ අය කිරිමට කටයුතු කරන බව. | හිඟ ණය ශේෂ අය කිරිමට කටයුතු කළ යුතුය. |

## 3.6 වාහන පද්ධතිය කළමනාකරණය

| සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය | සභාවේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව විසින් භාවිතා කරනු ලබන වාහන 20ක් සඳහා වාර්ෂික ආදායම් බලපත්‍ර සහ රක්ෂණ සහතික ලබා ගෙන නොතිබුණි. | ඉදිරි මූල්‍ය වර්ෂයේ වාර්ෂික ආදායම් බලපත්‍ර සහ රක්ෂණ සහතික ලබාගැනීමට කටයුතු කරන බව. | වාර්ෂික ආදායම් බලපත්‍ර සහ රක්ෂණ සහතික ලබාගැනීමට කටයුතු කළ යුතුය. |

## 4. ගිණුම්කටයුතු භාවය හා යහපාලනය

### 4.1 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

| සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය | සභාවේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභා බලප්‍රදේශයේ පවතින ඝන අපද්‍රව්‍ය භාවිතා කර කාබනික පොහොර සකස් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට නැගෙනහිර පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින සලසා තිබූ මූල්‍ය ප්‍රතිපාදනයෙන් රු.499,880 ක අමුද්‍රව්‍ය මිලදී ගෙන තිබුණි. මෙමගින් නිෂ්පාදනය කළ කාබනික පොහොර නිසි පරිදි ඇසුරුම් කර විකිණීමට සුදුසු අයුරින් නඩත්තු නොකර මධ්‍යස්ථානයේ අත්හැර දමා තිබුණි. | ඉදිරියේදි නිසි පරිදි ඇසුරුම් කර විකිණීමට සුදුසු අයුරින් නඩත්තු කිරීමට කටයුතු කරන බව. | නිසි පරිදි ඇසුරුම් කර විකිණීමට සුදුසු අයුරින් නඩත්තු කිරීමට කටයුතු කළ යුතුය. |

### 4.2 පාරිසරික ගැටළු

| සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය | සභාවේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| පසුගිය කාලයේ පරිසර බලපත්‍ර ලබාගෙන තිබූ කර්මාන්ත ආයතන 156ක් අතුරින් කර්මාන්ත ආයතන 46ක කල් ඉකුත් වූ බලපත්‍ර අලුත් කිරීමට කටයුතු කර නොතිබුණි. | කල් ඉකුත් වූ බලපත්‍ර අලුත් කිරීමට කටයුතු කරන බව. | පොත්පත් පවත්වා, පරිසර බලපත්‍ර නිකුත් කිරීමට කටයුතු කළ යුතුය. |